# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබද කමිටු සාකච්ජාව

දිනයඃ- 2001-09-26 වන දින පස්වරු 2.00 ට කෘෂිකර්ම අංශ කාර්යාලයේදි

සහභාගිත්වය

1. ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්
2. බී ඩී පී එස් විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්‍ෂ
3. ආචාර්ය ගාමිණි ද සිල්වා මහතා අධ්‍යක්‍ෂ
4. එස් මුදුනප්පෙරුම මහතා අධ්‍යක්‍ෂ
5. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්‍ෂ
6. ඒ ජේ සතරසිංහ මහතා ජේ. සංඛ්‍යාලේඛනඥ
7. ජේ දොඩම්ගොඩ මහතා ජේ. සංඛ්‍යාලේඛනඥ
8. ඩී ඩී එම් ඩී පෙරේරා මෙය ජේ. සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරි හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ජාව ආරම්භ විය.

02. මේදින පැවැති රැස්වීමේදී පූර්ව පරීක්‍ෂාව සඳහා කෙටුම්පත් කරන ලද කෘ.සං.1 හා කෘ.සං.2 උපලේඛන සහ ගණන්ගන්නා නිලධාරීන් සඳහා උපදෙස් වැඩිදුර සාකච්ජාව සඳහා ඉදිරිපත් කෙරිණ. තවද දත්ත භාවිතා කරන්නන් සඳහා සහ දිස්ත්‍රික් කාර්ය මණ්ඩල අදහස් විමසීම දින වකවානු ආදී කරුණු මෙන්ම ගණන්ගන්නා නිලධාරීන් ලෙස ගොවිසේවන නියාමක ද නැතහොත් ග්‍රාම නිලධාරීන් යොදා ගන්නේද යන්නත් එසේ යොදා ගැණිමේ දි ඔවුන්ගේ අධීක්ෂන කටයුතු සිදු කිරිමට යොදාගන්නා ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් පිළිබදවත් දීර්ඝ වශයෙන් සාකච්ජාවට යොමු විය.

එහිදී පහත තීරණයන්ට එළඹින.

- ගණන්ගන්නා නිලධාරීන් සහ ඔවුන්ගේ අධීක්ෂන කටයුතු සිදු කිරිමට යොදාගන්නා ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් පිළිබදව දිස්ත්‍රික් කාර්ය මණ්ඩලයේන් ද අදහස් විමසිම.

- ජන සංගණනයේ පූර්ව ලැයිස්තු ගත කිරිමේ ලේඛනය අනුව යමින් එම ලේඛන යාවත් කාලීන කරන අතරෙහි දිම කෘ.සං.1 උපලේඛනයේ ගොවිකාරකයින් ලෙස හදුනා ගත් පුද්ගලයින් සිටින ගෘහ මූලිකයින් ලැයිස්තු ගත කොට එම ගෘහ කාණ්ඩ වල සිටින ගොවිකාරකයින් සහ විස්තර ලබා ගැනීම. තවද කෘ.සං.1 හි කුඩා ගොවි කාණ්ඩ ලෙස සැලකෙන ගොවි කාණ්ඩ වල භෝග පිළිබද විස්තර ඇතුළත් කිරීමටත් විශාල ගොවි කාණ්ඩ ලෙස හඳුනාගත් එවා පිළිබද විස්තරාත්මක තොරතුරු කෘ.සං.2 ප්‍රශ්න මාලාවක් යොදා ගනිමින් විමසිම
- 10 වන කොටසින් ඉඩම් භාවිතය පිළිබඳව තොරතුරු ක්‍රමවත් නියැදුම් ක්‍රමය (Systamatic sampling Method) උපයෝගි කොට ගෙන සියයට දහයකගෙන් පමණක් විමසීම
- කරකයා නිශ්චිත ලෙස මෙන්ම කිසිවකු මග නොහැරෙන අයුරින් හඳුනා ගැණිම සඳහා පහසු වන උපදෙස් සැකසිම

- කෘ.සං.1 උපලේඛනයේ 9 වන තීරුව 7 හා 8 තීරු දෙකෙහිම 1 කව නොකරන ලද ගොවි කාණ්ඩ මෙම තීරුවෙහි අනුක්‍රමිකව අංක කර ඒවා සඳහා කෘ සං 2 උපලේඛනයක් බැගින් සම්පූර්ණ කරන ලෙස සංශෝධනය කිරීම

- එම ලේඛනයේම 10 සිට 36 දක්වා තීරු වලට උඩින් යොදා ඇති විස්තරයේ වරහන් තුල වූ කොටස මුලින් යෙදීම.
- එම ලේඛනයේම 12 තීරුව ගොවි කාණ්ඩයට ගෙවත්තක් ඇතුළත්ද යන්න විමසා පිළිතුර ඔව් නම් ඊළඟ කොටු දෙකෙහි ගෙවත්තේ බිම් ප්‍රමානය පර්චස් වලින් සටහන් කිරීමටත් නැත නම් කේතාංක 2 කව කිරීමටත් හැකිවන අයුරින් ප්‍රශ්නය යලි සකස් කිරීම
- උපලේඛනයේ හඳුනා ගැනීමේ තොතුරු මුල් පිටුවේ සටහන් කිරීමට හැකිවෙන අයුරින් සහ තීරු අතර සහ පේළි අතර වැඩි ඉඩකඩක් ලැබෙන අයුරින් ඒ 3 වර්ගයේ පෝරමයක මුද්‍රණය කිරීමට හැකිවන අයුරින් සැකසීම

- දත්ත භාවිතා කරන්නන්ගේ රැස්වීමට කලින් ප්‍රශ්න මාලාව ක්ෂේත්‍රයේ දී පූර්ව පරීක්‍ෂාවට භාජනය කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රශ්න මාලාව සහ සංගණනය පිළිබඳව සාමූහික අදහස් ලබා ගැනීම

<u>කෘ.සං.2 උපලේඛනය</u>

- කෘ.සං.1 උපලේඛනයේ යෙදූ අනුක්‍රමික අංකය කෘ.සං.2 උපලේඛනයේ ද යෙදීම සහ එම අංකය පළමු කාණ්ඩයේ සිට ග්‍රා නි කොටසේ අවසාන අංකය දක්වා අනුක්‍රමිකව අංකනය කිරීම

- අධ්‍යාපන තත්ත්වය පිළිබඳ උපදෙස් ගොවි කාරකයාගේ රැකියාව ආදිය සඳහා වූ කේත ජනසංගණන යේ දී භාවිතා කළ උපදෙස් පරිදි සකස් කිරීම
- 4 වන කොටස ස්ථිර භෝග ලෙස නම් කිරීම සහ 4.1 ප්‍රධාන වතු භෝග ලෙස නම් කිරීම
- 5 වන කොටසේ 5.1 ලෙස වී සහ 5.2 න් වෙනත් කාලීන භෝග ලෙස සැකැසීම

- 9 වන කොටසේ වූ මිරිදිය මසුන් පිළිබඳ වූ කොටස ඉවත් කිරීම

- 10 වන කොටසේ ගැහැණු යන යෙදුම වෙනුවට ගැහැණු සතුන් යන්නත් පිරිමි යන යෙදුම වෙනුවට පිරිමි සතුන් යන්නත් යෙදීම.

- වතු අංශයේ ප්‍රශ්න මාලාව සහ උපදෙස් සකස් කිරීමේ දී ඉහත දැක්වූ අදාල තීරණයන්ට අනුකූලව සකස් කිරීම

- දත්ත භාවිතා කරන්නන්ගේ රැස්වීම කැඳවීමට පෙර ප්‍රශ්නාවලිය පූර්ව පරීක්‍ෂාවට භාජනය කිරීම
- දත්ත භාවිතා කරන්නන්ගේ රැස්වීමට සමගාමීව ඔවුන්ගේ ලිඛිත අදහස් ලබා ගැනීම
- දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තන කටයුතු සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තකයන්ගේ සහාය ලබා ගැනීම

පස්වරු 5 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

ජේ. දොඩම්ගොඩ
සංඛ්‍යාලේඛනඥ